# සංස්කෘත පුරාණ සාහිත්‍යය

ශාස්ත්‍රවේදී බලදොර ඉන්දජෝති හිමි

ග්‍රන්ථ 18 කින් සමන්විත විශාල කෘති පෙළක් ලෙස පුරාණ සාහිත්‍යය අපට හමුවෙයි. එබැවින් ම දහඅට පුරාණය ලෙස ද මේ සාහිත්‍යකෘති එකතුව හැඳින්වෙනු දැකිය හැකිය.

එම කෘති 18 මෙසේ ය.

1. බ්‍රහ්ම පුරාණය
2. පද්ම පුරාණය
3. වෛෂ්ණව පුරාණය
4. ශෛව පුරාණය
5. භාගවත පුරාණය
6. නාරද පුරාණය
7. මාර්කණ්ඩේය පුරාණය
8. අග්නි පුරාණය
9. භවිෂ්‍යත් පුරාණය
10. බ්‍රහ්ම වෛවර්ත පුරාණය
11. ලිංග පුරාණය
12. වරාහ පුරාණය
13. ස්කන්ධ පුරාණය
14. වාමන පුරාණය
15. කූර්ම පුරාණය
16. මත්ස්‍ය පුරාණය
17. ගරුඩ පුරාණය
18. බ්‍රහ්මාණ්ඩ පුරාණය

පද්ම පුරාණයේ දී මේ සියල්ල සත්ව රජස් තමස් යන ගුණත්‍රයට අනුව බෙදීමක් දැකිය හැකිය. විෂ්ණු හා සම්බන්ධ වෛෂ්ණව, නාරදීය, භාගවත, ගරුඩ, පද්ම, වරාහ යන පුරාණ සාත්වික කොටසට ද බ්‍රහ්ම, බ්‍රහ්ම වෛවර්ත, මාර්කණ්ඩේය, භවිෂ්‍යත්, වාමන, බ්‍රහ්මාණ්ඩ යන බ්‍රහ්මන් හා සම්බන්ධ පුරාණ රජස් කොටසට ද ශිව හා සම්බන්ධ මත්ස්‍ය, කූර්ම, ලිංග, ශෛව (වායු) ස්කන්ධ අග්නි යන පුරාණ තමස් කොටසට ද එහි බෙදා දක්වා ඇත. නමුත් එම වර්ග කිරීම ගුණත්‍රයට අනුව යෙදීමේ විද්‍යාත්මක පදනම කුමක් දැයි සිතාගැනීම අපහසුය.



පද්ම පුරාණය ''පුරාණ'' යන වචනය නිර්වචනය කරන්නේ '' පරම්පරාං වක්ති පුරාණම්'' යනුවෙනි. මහාභාෂ්‍යය ව්‍යාඛ්‍යාවෙහි ද දැක්වෙන්නේ වංශයන් පිළිබඳව ප්‍රකාශ කිරීම ''වංශාද්‍යානුකීර්තනං පුරාණං'' පුරාණ වන බවයි. නමුත් එම නිර්වචන පුරාණ පිළිබඳ ව ප්‍රාමාණික දැක්මක් සඳහා මගපෑදීමට තරම් පොහොසත් නොවේ. අපගේ වැටහීම නම් පුරාණ ග්‍රන්ථ ලෝක නිර්මාණ, දේව උත්පත්ති, වංශ කතා ආදිය ප්‍රධාන කොට ගෙන විශ්ව කෝෂ බඳු ව පුළුල් මාතෘකා සමූහයක් සාකච්ඡා කළ සාහිත්‍යාංගයක් බවයි. නමුත් සියලු පුරාණ එක් ඒකකයක් ලෙස ගත් කල මිස වෙන් වෙන් කෘති ලෙස ගෙන සැලකීමේ දී එම ප්‍රකාශය සාධාරණ නොවන බව ද පැවසිය යුතුය. පුරාණ ග්‍රන්ථ අයත් වන්නේ ආගමික සාහිත්‍යයකටය. පැරණි ආගමක් වන බ්‍රාහ්මණ වාදයට වේදය යම් සේද පුරාණ සාහිත්‍යය හින්දු ආගම යැයි කියනු ලබන ආගමට එනම් විෂ්ණු හා ශිව වන්දනාව කූඨප්‍රාප්ත වන ආගමට අඩු වැඩි වශයෙන් සමාන වේ. පුරාණ ග්‍රන්ථ අපගේ වීරකාව්‍යද්වයට ද නෑකම් පෙන්වයි. ඇත්තෙන් ම මහාභාරතය විශාල වශයෙනුත් හරිවංශය සමස්තයෙනුත් ගත්විට පුරාණ හැර වෙනින් දෙයක් නොවන තරම්ය. රාමායණයට ද යම් යම් සබඳතා පෙන්වන බව පෙනීයයි. පුරාණ සාහිත්‍යාංගය ඉතා පැරණි අතීතයකට අයත් වෛදික සාහිත්‍යයට ද සබඳතා දක්වන බව පැවසිය හැකිය. එයට හේතුව පුරාණ ග්‍රන්ථාගත බොහෝ වෘත්තාන්ත ඍග්වේදයේ හා බ්‍රාහ්මණ ග්‍රන්ථවල පෙනෙන ආකාරයෙන් ම දැකිය හැකි වීමයි. අද අපට දැකිය හැකි පුරාණ නියම පැරණි කෘති නොවන බවට යම් යම් සාධක මෙම පුරාණ ග්‍රන්ථවලින් ද පරිබාහිර ග්‍රන්ථාගත සාක්ෂ්‍යවලින් ද ඔප්පු වේ. වින්ටර්නිට්ස් මහතා පවසන්නේ දැන් පවත්නේ ව්‍යාජ පුරාණ ග්‍රන්ථ කීපයක් බවයි. ඒවා හරියට ''පැරණි බෝතල්වල දැමූ අලුත් වයින් වැනි වේ'' යැයි ඔහු පවසයි.

මුලින් ම පුරාණ ලෙස හඳුන්වන්නට ඇත්තේ '' පුරාණම් ආඛ්‍යානම්'' යනුවෙන් පැවසෙන පරිදි පැරණි කථා විශේෂයක් විය හැකිය. බ්‍රාහ්මණ, උපනිෂද් හා බෞද්ධ ග්‍රන්ථවල අපට මේ වචනය හමුවන්නේ ඉතිහාස යන වචනය හා එක්වයි. එම

ඉතිහාස පුරාණ ලිඛිත තත්ත්වයක නොපවතින්නට ඇති බව විද්වත් මතයයි. එයින් ඉතිහාස නම් අංශය පිළිබඳ ව කෘති සම්පාදනය වූයේ ම නැත. නමුත් පුරාණ නම් අංශය පසුකාලීන ව කෘති බවට පත්විණි. එනම් ලිඛිත සාහිත්‍යයක් බවට පත්විණි. පුරාණ යැයි තනි ව නම හමුවන්නේ එසේ ග්‍රන්ථ තත්ත්වය ලැබුණු පසුව යැයි නිගමනය කළ හැකිය. එසේ නිත්‍ය කෘති තිබූ බවට පළමු පැහැදිලි සාක්ෂිය ලැබෙන්නේ සූත්‍ර සාහිත්‍යයෙනි. දැනට නෂ්ටප්‍රාප්ත නොවී ඇති පැරණි ම නීති ග්‍රන්ථයක් වන ගෞතම ධර්ම සූත්‍ර ග්‍රන්ථයේ රජු විසින් අධිකරණ කාර්යයේ දී ස්වකීය මගපෙන්වන්නන් හැටියට ගත යුත්තේ වේද, වේදාංග සහ පුරාණයැයි දක්වා ඇත. මෙහි පුරාණ යන භාවිතය සිදුකොට ඇත්තේ වේද යන වචනය භාවිත කොට ඇති ආකාරයට සමානවමය. මීටත් වඩා වැදගත් සාක්ෂිය ආපස්ථම්භීය ධර්ම සූත්‍රයෙන් හමුවේ. එහි පුරාණවලින් ගත් උද්ධෘත තුනක් දක්වේ. මුල් දෙක පුරාණවලින් ද තෙවැන්න භවිෂ්‍යත් පුරාණයෙන් ද ගත් බව එහි දැක්වේ. නමුත් මේ තෙවන උද්ධෘතය භවිෂ්‍යත් පුරාණයේ දැකිය නොහැකි බව වින්ටර්නිට්ස් මහතා පෙන්වා දෙයි. අනික් උද්ධෘත දෙක ද ආපස්ථම්භීය ධර්ම සූත්‍රයේ තිබෙන ආකාරයෙන් ම පද යෙදී තිබීමක් පුරාණවල දැකිය නොහැකි නමුත් යම් යම් සාමනකම් දක්වන බව ද එතුමා ප්‍රකාශ කරයි.

එම ධර්ම සූත්‍ර ක්‍රි.පූ. 5, 4 සියවස්වලට අයත් කිරීමට හේතු ඇති නිසා එබඳු කාලයක පවා දැන් පවත්නා පුරාණයන්ට සමාන කෘති තිබෙන්නට ඇති බව නිගමනය කළ හැකිය. එනම් මෙම පුරාණ සැකසෙන්නට ඇත්තේ වෙනත් එබඳු ම වූ පුරාණ කෘතිවලිනි. විද්‍යමාන මෙම පුරාණ ග්‍රන්ථ පැරණි පුරාණ ග්‍රන්ථයන්හි සංස්කරණයන් විය හැකිය.

පුරාණ සහ වීර කාව්‍යය (මහාභාරතය) අතර ඥාතිත්වය ගැන ද සඳහන් කළ යුතු ම වේ. පුරාණවල කාල නියමයට යම් උපකාරයක් එයින් ලැබෙන බැවිනි. මහාභාරතයේ අවසාන සංස්කරණය සිදුවන්නට පෙර පුරාණ පැවති බවට සාධක මේ දෙපක්ෂය අධ්‍යයනයෙන් ලබා ගත හැකිය. මහාභාරතය තමා පුරාණයක් යැයි හඳුන්වා ගනු ද පෙනේ. එපමණක් නොව පුරාණ



හා මහාභාරතය ආරම්භ වන්නේ එක ම ආකාරයකිනි. එනම් සූත ලෝමහර්ෂණගේ පුතා වන උග්‍රශ්‍රාවස් ප්‍රකාශ කරන ආකාරයෙනි. ශෞනක ඔහුට ආඛ්‍යානයෙහි යෙදෙන්නට ආරාධනා කරන්නේ '' ඔබගේ පියා වරක් සම්පූර්ණ පුරාණ උගත්තේය. පුරාණයන්හි කියනු ලබන දෙවිවරුන්ගේ කථා සහ මුනිවරුන්ගේ පෙළපත්වල කතා අපි ඔහුගෙන් බොහෝ කලකට පෙර අසා තිබේ. '' යනුවෙන් පවසමිනි. ''පුරාණයෙහි ඇසෙනු ලැබේ.'' යන්න මහාභාරතයේ නිතර දැකිය හැකි වාක්‍යයකි. බොහෝ පුරාණයන්හිත් වීරකාව්‍යවලත් පුරාවෘත්ත සහ උපදේශාත්මක ඡේදයන් පොදුවේ දැකිය හැකිය. තව ද මහාභාරතයේ දක්වෙනවාට වඩා පැරණි ස්වරූපයක් ගන්නා කොටස් ද පුරාණ ග්‍රන්ථවල දැකිය හැකි බව ලූඩර්ස් වැනි විද්වත්හු අදහස් දක්වති. මේ සියල්ලෙන් ම අපට පෙනෙන්නේ මහාභාරතයේ අවසාන සංස්කරණයට පෙර පුරාණ ග්‍රන්ථ සාහිත්‍ය විශේෂයක් හැටියට පැවතුණු බවයි. ඒ දැන් අප සතු පුරාණ ග්‍රන්ථදැයි යන්න නිශ්චය වශයෙන් ම කිව නොහැකි නමුත් මීට වඩා පැරණි, මෙම පුරාණවලට ගුරුතැන්හි සිටි පුරාණ ග්‍රන්ථ යැයි අනුමාන කළ හැකිය.

## පුරාණයන්ගේ පඤ්චලක්ෂණ

පුරාණ ග්‍රන්ථයක් නම් එය ලක්ෂණ පහකින් යුක්ත වීම අනිවාර්යයෙන් ම සිදුවිය යුතු බව බොහෝ පුරාණයන්හි දක්වෙන ප්‍රකාශයකි. එබැවින් ම පුරාණයන්ට ''**පඤ්ච ලක්ෂණ**'' නම් අපර නාමයක් ද වේ.

සර්ගශ් ච ප්‍රතිසර්ගශ් ච - වංශො මන්වන්තරාණි ච
වංශානු චරිතං චෛව - පුරාණං පඤ්චලක්ෂණම්

යන සඳහනට අනුව පුරාණයක් නම් එහි :

01. සර්ග හෙවත් ලෝක නිර්මාණය පිළිබඳ ප්‍රකාශන ද
02. ප්‍රතිසර්ග හෙවත් ලෝක විනාශය පිළිබඳ ප්‍රකාශන ද
03. වංශ හෙවත් දේව ඍෂි වංශ පිළිබඳ ප්‍රකාශන ද

04. මන්වන්තර හෙවත් මනුගේ පාලනය යටතේ පැවති යුග පිළිබඳ ප්‍රකාශන ද
05. වංශානු චරිත හෙවත් සූර්ය චන්ද්‍ර පරම්පරාවන්ගෙන් පැවත එන වංශ පිළිබඳ ප්‍රකාශන ද

නිත්‍යයෙන් ම අන්තර්ගත විය යුතුය. සත්‍ය වශයෙන් ම මේ කරුණු පහ දැනට විද්‍යමාන පුරාණ කෘතිවල අන්තර්ගතය පිළිබඳ කොටසක් පමණි. සමහර පුරාණවල මෙම ලක්ෂණ එකක් හෝ දෙකක් ද සමහර පුරාණවල පහ ම ද ඒ සෑම පුරාණයක ම තවත් වෙනත් දෑ පිළිබඳ ව ද කරුණු දක්වේ. පුරාණයන්ගේ පඤ්ච ලක්ෂණ අතරින් වැඩි අවධානයක් යොමු වී ඇත්තේ මෙහි තෙවැනි කාරණය වූ දෙවියන් පිළිබඳ කරුණු ගෙනහැර දැක්වීමට බව පහසුවෙන් අවබෝධ කොට ගත හැකිය. ඒ අතර බ්‍රහ්ම, විෂ්ණු,ශිව තිදෙනා ප්‍රධානත්වයක් හිමිකර ගනී.

මෙහි පඤ්චම ලක්ෂණයට අදාළ තොරතුරු සෑම පුරාණයක ම නැතත් කීපයක් තුළ සංග්‍රහ වී ඇති බව පෙනේ. ඒ අනුව හිරුගේ සඳුගේ ආරම්භයේ පටන් මහාභාරත යුද්ධයේ යෙදී සිටින වීරයින් දක්වා රාජ පෙළපත් පිළිබඳ විස්තරයක් මෙහි අන්තර්ගත වීම ඓතිහාසික ව කෙසේ වෙතත් සාහිත්‍යාත්මක ව පාඨකයාට යම් ප්‍රමෝදයක් ගෙන දෙයි. පුරාණයන්ගේ කර්තෘත්වය පැවරෙන්නේ ව්‍යාසයන්ට බැවින් ද ඔහු සිටියේ භරතයුද්ධයේ යෙදුණු වීරයින් හා සමකාලීන ව බැවින් ද ඔහු එම විස්තරය සපයා ඇත්තේ ජන කථා ඇසුරෙන් ය යන්න නිශ්චය කළ හැකිය. නමුත් මෙහි කතුවරයා ව්‍යාස බව කරන ප්‍රකාශයට බාධා පමුණුවන කරුණක් පුරාණයන්හි වේ. එනම් පාණ්ඩවයන්ගේ විස්තරයෙන් පසු අනාගතයේ පත්වන රාජ පරම්පරා හා රජවරුන් පිළිබඳ විස්තරයක් අනාවැකි ස්වරූපයෙන් ඉදිරිපත් කොට තිබීමයි. මෙම රාජ නාම ලැයිස්තුව අතර සිසුනාග, නන්ද, මෞර්ය, ශෘංග, ගුප්ත වැනි ඉතිහාසයේ ප්‍රසිද්ධ රාජ පරම්පරා තොරතුරු දැකිය හැකිය.



බිම්බිසාර අජාසත් වැන්නවුන් බුදුරජාණන් වහන්සේගේ සමකාලීනයන්ය. එනම් ක්‍රි.පූ. 6, 5 සියවස්වල විසූවන්ය. එම වර්ෂ ගණන් ගැනීම ලිඛිත ඉතිහාසයකින් සනාථ වී නැතත් ක්‍රි.පූ. 322 දී රජ පැමිණි මෞර්ය චන්ද්‍රගුප්ත රජු පිළිබඳ විස්තරයත් සමඟ පුරාණ ග්‍රන්ථාගත තොරතුරු ඉතිහාසයේ පැහැදිලි ආලෝකයට ප්‍රවිෂ්ඨ වේ. එතැන් පටන් අප දන්නා සාක්ෂි සහිත ලිඛිත ඉතිහාසයකට පැමිණෙන බැවිනි. නමුත් මෙම තොරතුරු ඓතිහාසික ව නිවැරදි දැයි යන්න විමර්ශනශීලී ව බැලිය යුතු බව ද පැවසිය යුතුය. වී.ඒ. ස්මිත් පඬිවරයා පෙන්වා දෙන්නේ විෂ්ණු පුරාණාගත මෞර්ය රාජ පෙළපත් විස්තරය ඉතාමත් විශ්වාසනීය මූලාශ්‍රයක් බවයි. මත්ස්‍ය පුරාණයේ ආන්ද්‍ර රාජ පෙළපත ගැන ද වායු පුරාණයේ පළමු චන්ද්‍රගුප්ත රජු ගැන ද දැකිය හැකි වේ. වායු පුරාණයේ එන එම විස්තරයෙන් පසුව අභිරාස්, ගර්දභ, සක, යවන, තුෂාර, හූණ යනාදී පහත් නීච යැයි හැඳින්වෙන පෙළපත් කීපයක් ගැන ද විස්තරයක් දැකිය හැකිය. චීන වන්දනා කරුවකු වූ සියුංයුං (Sungyun) වාර්තා කර ඇති ක්‍රි.ව. 465 දී පමණපන්ජාබයට කෙරුණු ම්ලේච්ඡ ආක්‍රමණ යැයි හැඳින්වෙන රාජ පෙළපත් අතර යම් සබඳතාවක් ද තිබිය හැකිය. ඉතිහාසය පිළිබඳ ව ගවේෂණය කරන්නෙකුට එම තොරතුරු සසඳා බැලීම වැදගත් වනු ඇත. මෙලෙස ඉතිහාසයේ සත්‍යය වශයෙන් ම සිදු වූ තොරතුරු පවා පුරාණයන්හි ඊට කලකට පෙර දැක් වූ අනාවැකි ලෙස ඉදිරිපත් වී තිබීම අපගේ විශ්මයට නොව විචාර බුද්ධියට හේතුකාරක කරගත යුතුවේ. කෙසේ වෙතත් මෙවැනි තොරතුරුවලින් පුරාණ පඤ්ච ලක්ෂණවලින් පස්වැන්න අර්ථවත් කළ බව පැහැදිලිය. එමෙන් ම දැන් අප අතර තිබෙන පුරාණ ලියවුණු කාලය පිළිබඳව යම් නිගමනයකට පැමිණීමට ද කතුවරයා පිළිබඳ සඳහන් ව්‍යාජ තොරතුරු ගැන සිතීමට ද අපට මෙම කරුණු උපස්ථම්භක වේ. ඒ පිළිබඳ නිශ්චිත නිගමනයකට පැමිණීම අපහසු බැවින් පැරණි පුරාණ ද ආශ්‍රය කර ගනිමින් එම පුරාණයන්හි කර්තෘවරයාට ම කර්තෘත්වය පවරා මෙම පුරාණ 18 පසුකාලීන ව සංස්කරණය කරන්නට ඇතැයි අපට සිතිය හැකිය. පඤ්ච ලක්ෂණයන් පිළිබඳ සෙසු ලක්ෂණ පුරාණයන්හි සංග්‍රහ වී ඇති ආකාරය පිළිබඳව සංක්ෂිප්තව දැක්වුවහොත් ලෝක නිර්මාණය පිළිබඳව බ්‍රහ්ම, ශිව, භාගවත, මාර්කණ්ඩේය, අග්නි, වරාහ, බ්‍රහ්ම

04. මන්වන්තර හෙවත් මනුගේ පාලනය යටතේ පැවති යුග පිළිබඳ ප්‍රකාශන ද

05. වංශානු චරිත හෙවත් සූර්ය චන්ද්‍ර පරම්පරාවන්ගෙන් පැවත එන වංශ පිළිබඳ ප්‍රකාශන ද

නිත්‍යයෙන් ම අන්තර්ගත විය යුතුය. සත්‍ය වශයෙන් ම මේ කරුණු පහ දැනට විද්‍යමාන පුරාණ කෘතිවල අන්තර්ගතය පිළිබඳ කොටසක් පමණි. සමහර පුරාණවල මෙම ලක්ෂණ එකක් හෝ දෙකක් ද සමහර පුරාණවල පහ ම ද ඒ සෑම පුරාණයක ම තවත් වෙනත් දෑ පිළිබඳ ව ද කරුණු දක්වේ. පුරාණයන්ගේ පඤ්ච ලක්ෂණ අතරින් වැඩි අවධානයක් යොමු වී ඇත්තේ මෙහි තෙවැනි කාරණය වූ දෙවියන් පිළිබඳ කරුණු ගෙනහැර දැක්වීමට බව පහසුවෙන් අවබෝධ කොට ගත හැකිය. ඒ අතර බ්‍රහ්ම, විෂ්ණු,ශිව තිදෙනා ප්‍රධානත්වයක් හිමිකර ගනී.

මෙහි පඤ්චම ලක්ෂණයට අදාළ තොරතුරු සෑම පුරාණයක ම නැතත් කීපයක් තුළ සංග්‍රහ වී ඇති බව පෙනේ. ඒ අනුව හිරුගේ සඳුගේ ආරම්භයේ පටන් මහාභාරත යුද්ධයේ යෙදී සිටින වීරයින් දක්වා රාජ පෙළපත් පිළිබඳ විස්තරයක් මෙහි අන්තර්ගත වීම ඓතිහාසික ව කෙසේ වෙතත් සාහිත්‍යාත්මක ව පාඨකයාට යම් ප්‍රමෝදයක් ගෙන දෙයි. පුරාණයන්ගේ කර්තෘත්වය පැවරෙන්නේ ව්‍යාසයන්ට බැවින් ද ඔහු සිටියේ භරතයුද්ධයේ යෙදුණු වීරයින් හා සමකාලීන ව බැවින් ද ඔහු එම විස්තරය සපයා ඇත්තේ ජන කථා ඇසුරෙන් ය යන්න නිශ්චය කළ හැකිය. නමුත් මෙහි කතුවරයා ව්‍යාස බව කරන ප්‍රකාශයට බාධා පමුණුවන කරුණක් පුරාණයන්හි වේ. එනම් පාණ්ඩවයන්ගේ විස්තරයෙන් පසු අනාගතයේ පත්වන රාජ පරම්පරා හා රජවරුන් පිළිබඳ විස්තරයක් අනාවැකි ස්වරූපයෙන් ඉදිරිපත් කොට තිබීමයි. මෙම රාජ නාම ලැයිස්තුව අතර සිසුනාග, නන්ද, මෞර්ය, ශෘංග, ගුප්ත වැනි ඉතිහාසයේ ප්‍රසිද්ධ රාජ පරම්පරා තොරතුරු දැකිය හැකිය.



බිම්බිසාර අජාසත් වැන්නවුන් බුදුරජාණන් වහන්සේගේ සමකාලීනයන්ය. එනම් ක්‍රි.පූ. 6, 5 සියවස්වල විසූවන්ය. එම වර්ෂ ගණන් ගැනීම ලිඛිත ඉතිහාසයකින් සනාථ වී නැතත් ක්‍රි.පූ. 322 දී රජ පැමිණි මෞර්ය චන්ද්‍රගුප්ත රජු පිළිබඳ විස්තරයත් සමඟ පුරාණ ග්‍රන්ථාගත තොරතුරු ඉතිහාසයේ පැහැදිලි ආලෝකයට ප්‍රවිෂ්ඨ වේ. එතැන් පටන් අප දන්නා සාක්ෂි සහිත ලිඛිත ඉතිහාසයකට පැමිණෙන බැවිනි. නමුත් මෙම තොරතුරු ඓතිහාසික ව නිවැරදි දැයි යන්න විමර්ශනශීලී ව බැලිය යුතු බව ද පැවසිය යුතුය. වී.ඒ. ස්මිත් පඩිවරයා පෙන්වා දෙන්නේ විෂ්ණු පුරාණාගත මෞර්ය රාජ පෙළපත් විස්තරය ඉතාමත් විශ්වාසනීය මූලාශ්‍රයක් බවයි. මත්ස්‍ය පුරාණයේ ආන්ද්‍ර රාජ පෙළපත ගැන ද වායු පුරාණයේ පළමු චන්ද්‍රගුප්ත රජු ගැන ද දැකිය හැකි වේ. වායු පුරාණයේ එන එම විස්තරයෙන් පසුව අභිරාස්, ගර්දභ, සක, යවන, තුෂාර, පූණ යනාදී පහත් නීච යැයි හැඳින්වෙන පෙළපත් කීපයක් ගැන ද විස්තරයක් දැකිය හැකිය. චීන වන්දනා කරුවකු වූ සියුංයුං (Sungyun) වාර්තා කර ඇති ක්‍රි.ව. 465 දී පමණපන්ජාබයට කෙරුණු ම්ලේච්ඡ ආක්‍රමණ යැයි හැඳින්වෙන රාජ පෙළපත් අතර යම් සබඳතාවක් ද තිබිය හැකිය. ඉතිහාසය පිළිබඳ ව ගවේෂණය කරන්නෙකුට එම තොරතුරු සසඳා බැලීම වැදගත් වනු ඇත. මෙලෙස ඉතිහාසයේ සත්‍යය වශයෙන් ම සිදු වූ තොරතුරු පවා පුරාණයන්හි ඊට කලකට පෙර දක් වූ අනාවැකි ලෙස ඉදිරිපත් වී තිබීම අපගේ විශ්මයට නොව විචාර බුද්ධියට හේතුකාරක කරගත යුතුවේ. කෙසේ වෙතත් මෙවැනි තොරතුරුවලින් පුරාණ පඤ්ච ලක්ෂණවලින් පස්වැන්න අර්ථවත් කළ බව පැහැදිලිය. එමෙන් ම දැන් අප අතර තිබෙන පුරාණ ලියවුණු කාලය පිළිබඳව යම් නිගමනයකට පැමිණීමට ද කතුවරයා පිළිබඳ සඳහන් ව්‍යාජ තොරතුරු ගැන සිතීමට ද අපට මෙම කරුණු උපස්ථම්භක වේ. ඒ පිළිබඳ නිශ්චිත නිගමනයකට පැමිණීම අපහසු බැවින් පැරණි පුරාණ ද ආශ්‍රය කර ගනිමින් එම පුරාණයන්හි කර්තෘවරයාට ම කර්තෘත්වය පවරා මෙම පුරාණ 18 පසුකාලීන ව සංස්කරණය කරන්නට ඇතැයි අපට සිතිය හැකිය. පඤ්ච ලක්ෂණයන් පිළිබඳ සෙසු ලක්ෂණ පුරාණයන්හි සංග්‍රහ වී ඇති ආකාරය පිළිබඳව සංක්ෂිප්තව දක්වුවහොත් ලෝක නිර්මාණය පිළිබඳව බ්‍රහ්ම, ශිව, භාගවත, මාර්කණ්ඩේය, අග්නි, වරාහ, බ්‍රහ්ම

වෛවර්ත, ලිංග, කූර්ම, මත්ස්‍ය, ගරුඩ, බ්‍රහ්මාණ්ඩ, ආදී පුරාණයන්හි ද ලෝක විනාශය පිළිබඳව ශිව, මාර්කණ්ඩේය, කූර්ම ආදී පුරාණ කීපයක ද මන්වන්තර හෙවත් මනුගේ යුග පිළිබඳව භාගවත, මාර්කණ්ඩේය, අග්නි, කූර්ම ආදී පුරාණයන්හි ද සූර්ය, චන්ද්‍ර වංශ පිළිබඳ ව සෑම පුරාණයකම වාගේ ද කරුණු දක්වේ. එක් එක් පුරාණ වෙන වෙන ම ගෙන බලන කල පඤ්ච ලක්‍ෂණවලින් සියල්ල දැකිය හැක්කේ පුරාණ ග්‍රන්ථ දෙක තුනක පමණි. අනෙක් පුරාණයන්හි එම ලක්‍ෂණයන්ගෙන් එකක් හෝ දෙකක් හෝ තුනක් පිළිබඳ ව කරුණු දක්වේ.

## අන්තර්ගත අවශේෂ විෂයයන්

පඤ්චලක්‍ෂණයන්ට අමතර ව පුරාණයන්හි බොහෝ විෂයයන් පිළිබඳ කරුණු අන්තර්ගත වීම ඒවායේ විශිෂ්ටත්වයට හේතු වේ. පාඨකයාහට මෙම කෘතිවලින් යම් දැනුමක් ලබා ගත හැක්කේ නම් එයින් වැඩි ගෞරවය හිමිවිය යුත්තේ ඒවායේ අන්තර්ගත අවශේෂ විෂයන්ට ය.පඤ්ච ලක්‍ෂණයන්ගෙන් බොහොමයක් මනඃකල්පිත කතාවලට ආසන්න වන බැවින් සහ අවශේෂ විෂයන් රැසක් පිළිබඳ ව කරුණු දක්වෙන බැවිනි. පුරාණයන්හි පඤ්චලක්‍ෂණ පිළිබඳ ව ඉහත දී කරුණු දක්වූ බැවින් මෙහි දී ඊට අමතර ව දැකිය හැකි අවශේෂ විෂයයන් පිළිබඳ ව පමණක් සංක්‍ෂේපයෙන් සඳහන් කරනු ලැබේ. එහි ද වැදගත් ම විෂයයන් පමණි.

අග්නි පුරාණය සහ ගරුඩ පුරාණය විශේෂ වටිනාකමක් ඇති පුරාණ කෘති දෙකකි. ඒවායෙහි විෂය ක්‍ෂේත්‍ර රාශියක් පිළිබඳ ව කරුණු අන්තර්ගත වීම එයට හේතුවයි. අග්නි පුරාණය ඒ අතර ද විශේෂිතය. එබැවින් ම අග්නි පුරාණය විශ්ව කෝෂයක් වැනි යැයි කානේ (kane) පඬිතුමා කියයි. මේ පුරාණ දෙකෙහි භූගෝලීය, ජ්‍යෝතිෂ, රාජ ධර්ම, යුද්ධ, ආයුර්වේද, ඡන්දස්, ව්‍යාකරණ, කාව්‍ය, නාටක, අලංකාර, යෝග, රත්න පරීක්‍ෂා, ප්‍රේත කොට්ඨාස ආදී බහුවිධ විෂයයන් ගැන කරුණු දක්වේ. පාලි පේතවත්ථුප්පකරණයට සමාන ව ප්‍රේතෝපාඛ්‍යානයක් ගරුඩ පුරාණයෙහි අන්තර්ගත වීම ද වැදගත් කොට සැලකිය හැකිය. මීට අමතරව සාංඛ්‍ය දර්ශනය පිළිබඳ ව



බ්‍රහ්ම පුරාණයේ ද යෝග දර්ශනය පිළිබඳ ව බ්‍රහ්ම, විෂ්ණු, ශිව, භාගවත, මාර්කණ්ඩේය, අග්නි ආදී පුරාණ රැසක ම ද දැකිය හැකිය. ඉන්දීය භූගෝලීය විස්තර බ්‍රහ්ම, භාගවත, අග්නි ආදී පුරාණයන්හි ද වේද හා වේද ශාඛා පිළිබඳව ද ජ්‍යෝතිෂය පිළිබඳව ද විෂ්ණු, භාගවත, අග්නි, ලිංග, ගරුඩ පුරාණයන්හි ද අර්ථ ශාස්ත්‍රය පිළිබඳව විෂ්ණු පුරාණයේ ද තොරතුරු අන්තර්ගත වේ. නවග්‍රහයන් පිළිබඳ ව විස්තරයක් භවිෂ්‍යත් පුරාණයේ දක්වෙන අතර, නීතිධර්ම පිළිබඳ ව වරාහ පුරාණයේ ද චිකිත්සා පිළිබඳ ව බ්‍රහ්මවෛවර්ත පුරාණයේ ද බෞද්ධ විහාර පිළිබඳ ව නාරදීය පුරාණයේ ද තොරතුරු දක්වේ.

සාහිත්‍යාත්මක ව වැදගත්කමක් ඇත්තාවූ ද එමෙන් ම පැරණි බ්‍රාහ්මණ ග්‍රන්ථ ආදියෙන් උපුටා ගත්තා වූ ද වීර කාව්‍ය මහාකාව්‍ය ආදියට බලපෑවා වූ ද දේව කථා, චරිත කථා රැසක් පුරාණයන්හි අන්තර්ගතය. පුරූරවස් චරිතය, ශකුන්තලා චරිතය, රාමෝපාඛ්‍යායනය පිළිබඳ පද්ම පුරාණයේ අන්තර්ගතවේ. මෙහි ශකුන්තලා කාලිදාසයන්ගේ ශාකුන්තලය නාට්‍යයට ආසන්න බවක් පෙන්වන අතර රාමෝපාඛ්‍යානයේ කොටසක් රාමායණයට ද කොටසක් රඝුවංශයට ද සමාන වේ. ශකුන්තලා පිළිබඳ ව භාගවත පුරාණයේ ද රාමායණය හා මහාභාරතය පිළිබඳව අග්නි පුරාණයේ ද සඳහන් වෙයි. සාවිත්‍රී, සත්‍යවාන්, සුරභි, ස්වධා ආදී උපාඛ්‍යාන රැසක් ගැන බ්‍රහ්මවෛවර්ත පුරාණයෙහි දක්වේ. මේ අනුව බහුවිධ විෂයාගත තොරතුරු පුරාණයන්හි අන්තර්ගත බව පැහැදිලි වේ.

පුරාණයන් අපහට හින්දු ආගමේ විවිධ පැතිකඩ සහ අවධීන් පිළිබඳ ව වඩාත් විශාල අන්තර් ඥානයක් ලබා දෙයි. පුරාණෝක්ති, රූප වන්දනා, දේව වන්දනා, දේව ප්‍රේමය, දර්ශනය, පූජා උත්සව සහ ආචාර ධර්ම ආදිය පිළිබඳ ව වෙන කිසිම කෘතියකට වඩා හොඳින් පුරාණ අපට කියා දෙයි.

සාහිත්‍යාත්මක ව විශාල වැදගත්කමක් පුරාණ තුළ නැත. නොසැලකිලිමත් භාෂා භාවිතය, දුර්වල පද්‍ය රචනය, බොහෝ සෙයින් විරිත් නිසා ව්‍යාකරණ බිඳීම පුරාණයන්හි දැකිය හැකිය. අන්තර්ගතය පිළිබඳ අවුල් සහගත තැන් ද පුරාණයන්හි දැකිය හැකිය.

ඍග්වේදයට අනුව ඌර්වශී පුරූරවස් සමඟ රැඳී සිටින්නේ අවුරුදු හතරකට ය. නමුත් විෂ්ණු පුරාණයේ ඔවුන් විනෝදයෙන් හා ඓන්ද්‍රිය ආශ්වාදයෙන් අවුරුදු 61000 ක් ගත කළ බව කියයි. භාගවත පුරාණය නිරයන්ගේ සංඛ්‍යාව කෙළසුවහසක් පමණ වන බව පවසයි. එසේ නමුත් රාජ්‍යයන් පිළිබඳ බොහෝ පැරණි පුරාවෘත්තයන් සහ පෙළපත් පිළිබඳ පද්‍යයන් එනම් අනුවංශ ශ්ලෝක සහ ගීත, පැරණි විරුදාවලී හෙවත් ජන ගායනා කණ්ඩායම්වලින් බේරා රක්‍ෂණය කොට මෑතකාලීන පුරාණයන්ට අන්තර්ගත කොට තිබීම වැදගත් කොට සැලකිය යුතුය.

මෙලෙස විමර්ශනය කරන විට පුරාණයන් සංස්කෘත සාහිත්‍යයේ එක් අංශයක් නියෝජනය කරන, හින්දු ආගමේ ප්‍රධාන අංශයන් නියෝජනය කරන, පාඨකයාගේ බහුවිධ බුද්ධි මණ්ඩලයන් පෝෂණය කරන වැදගත් ග්‍රන්ථ සමූහයක් බව පැහැදිලිය. නමුත් මෙතෙක් සංස්කෘත භාෂාව හා සාහිත්‍යය අධ්‍යයනය කළ සියලු දෙනා පුරාණයන් කෙරෙහි දක්වූ අවධානය ප්‍රමාණාත්මක නොවන බව ද පැවසිය යුතු වෙයි.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. අග්නි පුරාණම්, ප්‍රථම සංස්කරණය, කල්කටා
2. පද්ම පුරාණය-ප්‍රථම භාග, ආනන්දාශ්‍රම මුද්‍රණාල 1814
3. බ්‍රහ්ම වෛවර්ත පුරාණම්:- ප්‍රථම භාග ආනන්දාශ්‍රම මුද්‍රණාල 1857
4. තිලකසිරි. ජේ.,සංස්කෘත කාව්‍ය සාහිත්‍යය ,දෙවන මුද්‍රණය 1999, එස්. ගොඩගේ සහෝදරයෝ, කොළඹ.
5. පඤ්ඤාලෝක හිමි, පොල්වත්තෙ, සංස්කෘත ග්‍රන්ථ වංශය, කේ.ඇල්.ටී. ගුණරත්න , 1952
6. Nariman J.K.,Literary History of sanskrit,Buddhism, 2nd ed. 1923, Delhi
7. Winternitz,M.A., History of Indian Literature, vol.01, University of Calcutta.